# කෘෂිකර්ම අමාත්‍යාංශය

# කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය

# උතුරු මැද පළාත

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ලෝක බැංකු ණය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය, කුඩා පරිමාණ ගොවිත්ට තරගකාරී සහ අලෙවි කළ හැකි කෘෂි නිෂ්පාදනයන් වැඩිදියුණු කරගැනීමට සහ වාණිජ ගොවිතැන් කරා නැඹුරු කරවීම සඳහා සහයෝගය ලබා දේ. මෙම ව්‍යාපෘතියේ උතුරු මැද පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින පහත සඳහන් තනතුරහි පුරප්පාඩුව පිරවීම සඳහා, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව මතු දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ඉල්ලුම්කරුවන් වෙතින් අයදුම් පත් කැඳවනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (PS 3) – තනතුරු 01 යි

**ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය සහ වගකීම්:**

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ කෘෂි තාක්ෂණික ආදර්ශන උද්‍යාන පිහිටුවීම සහ ඊට අදාල යටිතල පහසුකම් සංවර්ධනයයි. ඒ අනුව ඉහත තනතුරට අදාල කාර්යභාරය සහ වගකීම් වනුයේ, කාර්යක්ෂම සහ ඵලදායි ලෙස කෘෂි තාක්ෂණ ආදර්ශන උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම උදෙසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, රේඛීය ආයතන, සේවා සපයන්නන්,කොන්ත්‍රාත්කරුවන්, ගොවි සංවිධාන,ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් මනාව සම්බන්ධීකරණය කරමින්, හඳුනාගත් නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු සහ ඉලක්ක කරා යාමට, ව්‍යාපෘති කණ්ඩායමේ ඵලදායි හා කාර්යක්ෂම සාමාජිකයකු ලෙස කටයුතු කිරීමයි.

**අවශ්‍ය සුදුසුකම්:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක සාමාජිකත්වය /පිළිගත් වෘත්තිය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තිය සුදුසුකම් සමඟ,

   කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

**හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසු කමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක සාමාජිකත්වය /පිළිගත් වෘත්තිය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තිය සුදුසුකම් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අදාළ වෘත්තිය ආයතනයක වරලත් සාමාජිකයෙක් වීම සමඟ,

   කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 8 ක පළපුරුද්ද.

**හෝ**

3. දීප ව්‍යාප්ත සේවයක පළමු පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ අයෙකු වීම සමඟ,

   පළමු පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

**තෝරාගැනීමේ ක්‍රමවේදය:**

සුදුසුකම් සහ පළපුරුද්ද මත පාදකව,කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

වැටුප:2019.03.05 දිනැතිව නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/ 2019 මත පදනම් වනු ඇත.

**පොදු කොන්දේසි:**

අ) වයස් සීමාව–අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 64 නොඉක්මවා තිබීම.

ආ) සේවා කොන්දේසි –රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් ද්විතීය පදනම මත බඳවාගනු ලබන අතර,රජයේ සේවයෙන් බැහැර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.සියලුම පත්වීම් සහ සේවා කාලය දීර්ඝ කිරීම් 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පාදක කර සිදු කරනු ලැබේ.

**අයදුම්පත්:**

සියලුම අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම් පත් ජීව දත්ත තොරතුරු ප්‍රකාශ සමඟින්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිතව 2021 අප්‍රේල් මස 19 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් අදාළ දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ.

අයදුම්පත් බහාලනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

මේ පිළිබඳව යම් වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම්,071 – 4899021යන දුරකථන අංකයෙන් ,කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ මගින් ලබාගත හැකිය.

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**
**2021.04.04**